# සන්නස

**Sannasa**
244 Princes Hwy
Hallam Vic 3803 Australia
**Web: www.sannasa.net**
**www.sannasa.com**
email :sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241**after 4pm**

**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සංස්කරණ උපදේශක / Editorial Advisor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක / Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රචා / Graphics**
ශානලී එදිරිසිංහ Shanalee Edirisinghe

**වෙළඳ දැන්වීම් / Advertising**

**S Jayasinghe**
03 8707 4604
0402 025 516
email- sjturaus@optusnet.com.au

**Kuma Gamage**
0414 215 280
email- ads.sannasa@gmail.com

**Account Details for Payments**

**Account Name** - **Sannasa Media**
Bank - Westpac
BSB Number - 033 341
Account Number - 590847

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වී ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ
මහින්ද දිසානායක දිවුල්ගනේ

**ඡේයා රූ / Photography**
Prasanna Kurukularatna

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku

**QLD**
Ananada Samaratunga
2, Santorini Pl.
Forest Lake
QLD 4078
(07) 3372 7958

**WA**
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhdist Vihara

**ACT**
Asoka Nimalasiri
0400 429 031

**SA**
Chandra Eeriyagama
08 8331 2318


පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත



**සමානාත්මතාව තුළින් මිත්‍රත්වයේ මාවත විවරවේ**
**ප්ලේටෝ**

## ලියා දන්වන වගයි

### රට ගත යුතු අත

උගුව පළාත් සභා මැතිවරණ ටෙලි නාට්‍යයක් බඳුය. ප්‍රේක්ෂක හුදී ජනයා ගේ සිත් පිනවන දසුන් අපමණය. ත්‍රාසය භීතිය ආදරය ආදී මෙකී නොකී සියලුම රස භාවයන් උගුව පළාත් සභා මැතිවරණ සංග්‍රාමය දෙස බලා සිට විඳ ගැනීමේ වාසනාව ශ්‍රී ලාංකික පොදු ජනතාවට හැකිවී තිබෙයි.

නාමයෝජනා දුන් දවසේම නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරයකුටම තර්ජනය කර ඇරඹෙන මෙම සිදුවීම් මාලාව දැන් දැන් කඩු අතින් ගෙන ප්‍රසිද්ධියේ සටනට බැස සිටින අපේක්ෂකයන්ගේ දසුන් දක්වා ඉදිරියට ගොස් ඇත.

අංක තහඩු නැති ඩිෆෙන්ඩර් රථ වලින් රාත්‍රියට පැමිණ විරුද්ධපක්ෂ ඡන්දාපේක්ෂකයන්ගේ මැතිවරණ කාර්යාල කඩා බිඳ දැමීම දැන් සෙල්ලමක් වී ඇත. පොලීසිය කියන්නේ තමන් ඒ කිසිවක් නොදන්නා බවය. ඒ ගැන පුදුම වන්නට හේතුවක් නැත. මේ පහර දෙන්නන් කවුදැයි පොලිසිය හොඳින් දනියි. අඩු කඩා දමා නිවට කර ඇති පොලිසියකටත් සිනාසෙන්නට පමණක් දන්නා මැතිවරණ කොමසාරිස්වරයකුටවත් කළ හැකි කෙංගෙඩියක් නැත. විධායකයේ අසීමිත බලතල විසින් සියල්ල හික්මවනු ලැබ ඇත.

මේ ව්‍යසනය නැවත නැවත දැකීමේ පාපයෙන් ගැලවීමට නම් මේ බිහිසුනු ව්‍යවස්ථාව ඉරා සියල්ල අලුතින් සකස් කළ යුතුය. එක්සත් ජාතික පක්ෂය තමන්ගේ තාවකාලික වාසියට එදා හැදූ මේ ව්‍යවස්ථාව අද ඔහුන්ටම පාරාවළල්ලක් වී ඇති සැටි දැකීම කදිමය. එසේ තිබියදී අවුරුදු 20 කට පසු රජය පෙරළා දැමීමේ මහගු අවස්ථාවක් උදා ව තිබියදී රනිල් වික්‍රමසිංහ යෙදී සිටින්නේ ආත්මාර්ථයෙන් පිරී ගිය අඥාන රංගනයකය. සියලු පක්ෂ එකට එක්වන්නේ නම් එළැඹෙන ජනාධිපතිවරණයකදී රජය පෙරළා දැමීමේ වරමක් ලබාගත හැකිය. ඒ සඳහා එක්සත්ව පොදු අපේක්ෂකයකු ඉදිරිපත් කළ යුතුය. රනිල් වික්‍රමසිංහ මේ වසා දමන්නේ ඒ මහගු අවස්ථාවයි.

එක්සත් ජාතික පක්ෂයට තනිව පැමිණ කිසිදා මේ රජය පරාජය කළ නොහැකි බව නොදන්නේ රනිල් වික්‍රමසිංහ ඇතුළු එම පක්ෂයේ නායක කාරකාදීන් පමණිකි. ඔවුන් හැරෙන්නට මුලු රටම ඒ බව දනියි.

මහින්ද රාජපක්ෂට තුන්වන වරට ජනාධිපති අපේක්ෂකත්වය ඉල්ලීමට ව්‍යවස්ථාවෙන් බලයක් නැතැයි දැන් කියැවෙයි. ඒ පිළිබඳ අර්ථකථයක් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් රහසිගතව ඉල්ලා ඇති බවත් ඉදිරි සතියේදී ඒ අර්ථ දැක්වීම සිදුවනු ඇති බවත් දැනගන්නට ඇත. හීලෑ කරන ලද අධිකරණයකින් ලැබෙන තීරණය පිළිබඳව ඕනෑවට වඩා බලාපොරොත්තු තබා ගත නොහැකිය. කළ යුතු හොඳම දෙය සූදානම් වීමයි. පොදු අපේක්ෂකයකු ඉදිරියට ගෙන ඒමයි. ඒ පිළිබඳ නිසි දැක්ම රනිල් වික්‍රමසිංහට පහළවන්නේ නම් එය රටේ වාසනාවයි.

සංස්කාරක



සුරූපී නිලි ෆර්ඩිනැන්ඩස්

# පාන් නැතිනම් කාපල්ලා බිත්තර ආප්ප

**රාමචන්ද්‍ර**

නිදහස් චතුරශ්‍ර ආකේඩයේ පැවැති විලාසිතා සංදර්ශනයක් ලාංකීය සම්භවයක් සහිත ඉන්දියානු නිලි ජැකොලයින් ෆර්ඩිනැන්ඩස් විසින් කෑම සූත්‍ර නමින් ආරම්භ කොට ඇති ආපන ශාලාව පසුගිය දවස් වල ජනමාධ්‍යයන්ගේ සැලකිය යුතු අවධානයකට ලක්විය. ඕපාදූප වෙබ් අඩවි විසින් වාර්තා කර තිබූ එක් ජනප්‍රිය පුවතක් වූයේ එම අවන් හලේ බිත්තර ආප්පයක් රුපියල් 200 ක් වන බවත්, ආප්පයක් රුපියල් 100 ක් වන බවත්ය.

කොළඹ නිදහස් චතුරශ්‍රය අසබඩ නව සුපිරි වෙළඳ සංකීර්ණයක් මහත් ප්‍රචාරයක් ලබා දී පසුගිය ජූලි මාසයේදී ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් විවෘත කරන ලද්දේය. එම සංකීර්නයේ බොහෝ සාප්පු සමන්විත වන්නේ මෙවැනි අධි මිල වෙළඳ භාන්ඩ වලින්ය. ජැකොලයින් ෆර්ඩිනැන්ඩස්ගේ අවන්හල පිලිබද අලංකාරිකය පසුගිය කාල සීමාව තුළ මෙරට සීඝ්‍ර වර්ධනයක් ලබමින් සිටින එක් වැදගත් ආර්ථික සමාජ උද්ගතයක් පිළිබද ප්‍රකාශනයකි. එම උද්ගතය හැඳින්වීමේ පහසුව පිනිස 'සුබෝපභෝගී වෙළඳ සේවා කර්මාන්තයි' ලෙස නම් කරමු.

ගාලු මුවදොර අසල පැරණි ඕලන්ද රෝහල ද මෙබඳු සුපිරි වෙළඳ සාප්පු සංකීර්නයකට උදාහරණයකි. ක්‍රිකට් ක්‍රීඩක කුමාර් සංගක්කාර - මහේල ජයවර්ධන යුවල මිනිස්ට්‍රි ඔෆ් ක්‍රැබ්ස් නමින් එහි සුපිරි අවන්හලක් කලෙකට පෙර ඇරඹූහ.

මේ ආපනශාලා ස්ථානගත වන්නේ පොදු ජනයාගෙන් ඉතාමත් දුරස්ථ අවකාශයකය. ඒ දුරස්ථභාවය නිර්මානය කරන්නේ මිල දී ගැනීමේ හැකියාව විසිනි. කොළඹ නගරය තුළ සුබෝපභෝගී මහල් නිවාස ව්‍යාපෘති මේ වනවිට ඉදිවෙමින් තිබේ. මේවා ඉදි කෙරෙන්නේත් සමාජයේ ඉහල ක්‍රය ශක්තියක් තිබෙන ධනවත් සමාජ ස්ථර ඉලක්ක කරගෙනය. "කෑම සූත්‍ර" හෝ වේවා "මිනිස්ට්‍රි ඔෆ් ක්‍රැබ්ස්" හෝ වේවා - මේ සේවා හා වෙළඳ භාණ්ඩ වල සුබෝපභෝගීත්වය ඒවායේ මිල විසින් නිර්නය කොට ඇත. නිදහස් චතුරශ්‍රයේ අලුත විවෘත කල සාප්පු සංකීර්ණය ගතහොත්, එහි ඇති සාප්පු තුලට ගොස් බඩු මිලදී ගනු දැකිය හැක්කේ අතලොස්සක් දෙනෙකි. එය නැරඹීමට එන බොහෝ සාමාන්‍ය මිනිසුන් කරන්නේ එම ගොඩනැගිල්ලේ සුන්දරත්වය බලමින් ඔබ මොබ ගමන් කිරීමය. අධික මිල නමැති ප්‍රාකාරය සාමාන්‍ය ජනයා

***සමාජයේ එක් කෙලවරක සුබෝපභෝගී ආකේඩ ඉදිවෙද්දී සමාජයේ අනිත් කෙලවර තුල ගොඩ ගැසෙන්නේ මොනවාද? දෛනික ජීවිතය පවත්වා ගැනීම සඳහා නොකඩවා කෙරෙන වැඩ කිරීම, මහන්සිය, විඩාව, අතෘප්තිය, පීඩාව සහ දුක් ගැනවිලිය.***

6 වන පිටට